LIBRARY
1979 - 5 - 30
COLOMBO.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 25 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිකාරය පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මැයි මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. | තැපැල් ගාස්තුව : ශත 25 යි.

# 1979 අංක 25 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිභාරය පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 8/79.

1978 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු නියම කරනු ලැබිය යුතු සෑම තැනැත්තකු සම්බන්ධයෙන්ම, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා ගෙවිය යුතු ආදායම් බද්ද අනුසාරයෙන් අධිභාරයක් පැනවීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 25 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිභාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අධිභාරය පැනවීම.

2. (මේ පනතෙහි "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු නියම කරනු ලැබිය යුතු සෑම තැනැත්තකු ම, වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් සම්මුතියක, ප්‍රදානයක නැතහොත් ගිවිසුමක කුමක් සඳහන් ව ඇත ද අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු ප්‍රමාණයෙන් සියයට විස්සකට සමාන අධිභාරයක් ගෙවීමට යටත් විය යුතු ය.

මේ වගන්තියෙහි කාර්යයන් සඳහා "ආදායම් බද්ද" ට—

(අ) මහජන සමාගමක් නොවන වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට, දේශීය ආදායම් පනතේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද;

(ආ) නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට, දේශීය ආදායම් පනතේ 26 වන වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද අතුරින් ඒ වගන්තිය යටතේ සියයට 33 1/3 ක අනුප්‍රමාණය මත ආගණනය කරනු ලබන කොටස; සහ

(ඇ) මහජන සමාගමක් සම්බන්ධයෙන් වූ විට, දේශීය ආදායම් පනතේ 25 වන වගන්තියෙහි (1ආ) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද

ඇතුළත් නොවිය යුතු ය.

ඒ 40254—11,700 (79/05)

අදාළ වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත ආදායම සේවා නියුක්තියේ ලාභවලින් පමණක් හෝ සේවා නියුක්තියේ සහ සේවා නියුක්තිය නොවන වෙනත් ප්‍රභවයන්ගේ ලාභවලින් සමන්විත වන්නේ යම් තැනැත්තන්ගේ ද, ඒ තැනැත්තන්ට අදාළ වන විශේෂ විධිවිධාන.

3. (1) අදාළ වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම යම් සේවානියුක්තියක ලාභවලින් පමණක් සමන්විත වන අවස්ථාවක, 1979 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 1979 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ ඔහු යෙදී සිටි යම් සේවානියුක්තියකින් ඔහු ලැබූ ලාභ සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්ද, 2 වන වගන්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු අධිභාරයෙහි ප්‍රමාණය ආගණනය කිරීමේ කාර්යය සඳහා, අදාළ වර්ෂය වෙනුවෙන් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු මුළු ආදායම් බද්ද බව සලකනු ලැබිය යුතු ය.

(2) අදාළ වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම යම් සේවානියුක්තියක ලාභවලින් සහ සේවානියුක්තිය නොවන වෙනත් ප්‍රභවයන්ගේ ලාභවලින් සමන්විත වන අවස්ථාවක,—

(අ) 1979 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 1979 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ ඔහු යෙදී සිටින යම් සේවානියුක්තියකින් ඔහු ලැබූ ලාභ සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්දෙහි ; සහ

(ආ) අදාළ වර්ෂය සඳහා සේවානියුක්තිය නොවන වෙනත් ප්‍රභවයන්ගෙන් ඒ තැනැත්තාගේ ලාභ සහ ආදායම, ඒ වර්ෂය සඳහා ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමට යම් ප්‍රමාණයකට අනුපාත වේ ද, ඒ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු මුළු ආදායම් බද්දෙන් ඒ අනුපාතයට සමාන වන්නා වූ කොටසෙහි

එකතුව, 2 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු අධිභාරයෙහි ප්‍රමාණය ආගණනය කිරීමේ කාර්යය සඳහා අදාළ වර්ෂය වෙනුවෙන් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු මුළු ආදායම් බද්ද ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිභාරය ගෙවීම.

4. 2 වන වගන්තිය යටතේ අධිභාරයක් ගෙවීමට යටත් වන සෑම තැනැත්තකු ම විසින්, පිළිවෙලින් 1979 මැයි, අගෝස්තු සහ නොවැම්බර් යන මාසවල පහළොස් වන දින හෝ එදිනට පෙර සමාන වාරික තුනකින් ඒ අධිභාරයෙහි මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය.

5. ආදායම් බද්ද තක්සේරු කිරීමට, ආදායම් බද්ද පිළිබඳ තක්සේරුවට විරුද්ධව අභියාචනය කිරීමට, ආදායම් බද්ද ගෙවීමට සහ අයකර ගැනීමට අදාළ, දේශීය ආදායම් පනතේ XI වන, XIඅ වන, XII වන, XIII වන, XIIIඅ වන සහ XIV වන පරිච්ඡේදවල විධිවිධාන, 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අධිභාරය තක්සේරු කිරීම, අධිභාරය පිළිබඳ තක්සේරුවට විරුද්ධව අභියාචනය කිරීම, අධිභාරය ගෙවීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

දේශීය ආදායම් පනතෙහි ඇතැම් විධිවිධාන අධිභාරය තක්සේරු කිරීම, අය කර ගැනීම සහ ගෙවීම සම්බන්ධයෙන් අදාළ විය යුතු බව.

6. අදාළ වර්ෂය සඳහා යම් තැනැත්තකුගෙන් නිසි පරිදි අය කර ගනු ලැබිය යුතු ආදායම් බද්ද ඉක්මවා ඔහු විසින් ආදායම් බදු වශයෙන් ගෙවන ලද යම් මුදලක් ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට දේශීය ආදායම් පනතේ 117 වන වගන්තිය යටතේ හිමිකම් ලැබෙන අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අධිභාරය ඔහු ගෙවා ඇත්නම්, 117 වන වගන්තිය යටතේ ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම ඇති මුදලෙන් සියයට විස්සකට සමාන අතිරේක මුදලක් ද ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

ආපසු ගෙවීම.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි,—

අර්ථ නිරූපණය.

"දේශීය ආදායම් පනත" යන්නෙන් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත අදහස් වේ;

"ආදායම් බද්ද" යන්නෙන් දේශීය ආදායම් පනත යටතේ පනවා අය කරනු ලබන ආදායම් බද්ද අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා", "සමාගම", "මහජන සමාගම", "තැනැත්තා", "ලාභ", "ලාභ සහ ආදායම", "යම් සේවා නියුක්තියකින් ලාභ", "ව්‍යවස්ථාපිත ආදායම" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වල පිළිවෙලින් ඒවාට දේශීය ආදායම් පනතෙහි දී ඇති අර්ථය ම විය යුතු ය.